" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ISO/IEC: 17021 QMS-001-01
ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
අතුරු දුරකථන தொலைபேசி நீட்சி General Telephone 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/18
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2022.02.14

මූල්‍ය වක්‍රලේඛ 07/2022

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය
රජයේ දේපල විනාශවීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම අහිමිවීම වැලැක්වීමට රජයේ වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම.

භාණ්ඩාගාර ලේකම්ගේ 2022.01.25 දිනැති "රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රජයේ දේපල විනාශවීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම අහිමිවීම වැලැක්වීමට රජයේ වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම." සම්බන්ධයෙන් නිකුත් කරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක 04/2022 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.02.09 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් වක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම වක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ඒ.එම්.එස්.මල්කාන්ති,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)(වැ.බ)
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை
The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය அலுவலகம் Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් பெக்ஸ் Fax: (94)-11-2449823
වෙබ් අඩවිය வெப் சைட் Website: www.treasury.gov.lk

මගේ අංකය எனது இல. My No. CGO/ASM/Policy/Cir/ (VOL II)
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date: 2022.01. 21

වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක : 04/2022

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම අහිමිවීම වැලැක්වීමට රජයේ වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම

අමාත්‍ය මණ්ඩලය විසින් නියෝග කරන ලද පරිදි 2020 ඔක්තෝම්බර් 02 නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක: 05/2020 මඟින් උපදෙස් ලබාදී නිබියදීත් ධාවන තත්ත්වයේ නොපැවති වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමේ හෝ අපහරණය කිරීමේ ප්‍රගතිය සතුටුදායක නොවන බව සැලකිල්ලට ගෙන, මෙම වත්කම් විනාශ වීමට ඉඩහැරීම සහ රජයේ ආදායම අහිමිවීම වැලැක්වීම උදෙසා, වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය, 2022 ජනවාරි 10 දින පැවති රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලය විසින් අවධාරණය කර ඇත.

02. ඒ අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුලු සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය කටයුතු කලයුතු වේ:

අ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම

2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම මේ වන තෙක් සිදු කර නොමැති ආයතනවල ප්‍රධානීන් විසින්, වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක: 05/2020 හි 02 (අ) මඟින් ලබාදී ඇති උපදෙස් පරිදි, එවැනි වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කල යුතු වේ.

ආ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම් ඵලදායී වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම

2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම් ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම් මේ වන තෙක් සිදු කර නොමැති ආයතනවල ප්‍රධානීන් විසින්, වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක: 05/2020 හි 02 (ආ) මඟින් ලබාදී ඇති උපදෙස් පරිදි, එවැනි වාහන අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදුකල යුතු වේ.

ඇ). රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම් සහ රජයේ ආදායම් අහිමිවීම් වැලැක්වීම් උදෙසා, වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම

අවශ්‍ය උපදෙස් වක්‍රලේඛ මඟින් ලබාදී තිබියදීත්, අදාල රාජ්‍ය ආයතන විසින් වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම් හෝ අපහරණය කිරීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන්, අලුත්වැඩියා කල යුතු හෝ අපහරණය කල යුතු වාහන විශාල ප්‍රමාණයක් රජයේ ආයතන සතුව තවදුරටත් පවතින බව වාර්තා වේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි, රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම් සහ රජයේ ආදායම් අහිමිවීම් වැලැක්වීම් උදෙසා, නිසි පරිදි නඩත්තු කිරීම් හා නොසැලකිලිමත් භාවිතයෙන් තොරව වාහන නිසි පරිදි භාවිතා කිරීම් මෙන්ම අදාල වක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් අවශ්‍ය පරිදි නොපමාව වාහන අපහරණය කිරීම්, සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ අනිවාර්ය කාර්යයක් වන බව, මෙයින් අවධාරණය කරමි.

03. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම් සඳහා, ඉහත 02හි (අ) හා (ආ) හි සඳහන් උපදෙස් පරිදි අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු මේ සමඟ ඇති ඇමුණුමෙහි සඳහන් පරිදි, 2022 අප්‍රේල් 30 දිනට පෙර, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කලයුතු වේ.

එස්.ආර්. ආටිගල

භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1 ජනාධිපති ලේකම්
2 අග්‍රාමාත්‍ය ලේකම්
3 අමාත්‍ය මණ්ඩල ලේකම්
4 අයවැය අධ්‍යක්ෂ ජනරාල්
5 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්
6 විගණකාධිපති